මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்திய மாகாண சபையின் அரச சேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council

අංක 244, කටුගස්තොට පාර, මහනුවර
இல. 244, கடுகஸ்தொட்டை வீதி, கண்டி
No. 244, Katugasthota Road, Kandy.

e-mail: psc.cp.gov@gmail.com
web site: www.psc.cp.gov.lk

කාර්යාලය / காரியாலயம் / Office – 081-2213097
ලේකම් / செயலாளர் / Secretary – 081-2213096
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst. Secretary – 081-5631321
ෆැක්ස් / பெக்ஸ் / Fax – 081-2213096, 081-2213082

මගේ අංකය / எனது இல. / My No. CPC/PSC/7/1
ඔබේ අංකය / உமது இல / Your No.
දිනය / திகதி / Date 2024.06. 17

ලේකම්,
ප්‍රධාන හා අධ්‍යාපන අමාත්‍යාංශය,
මධ්‍යම පළාත.

<u>මධ්‍යම පළාත් සභාවේ ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය</u>

මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක :GCP/05/01/39(වක්‍රලේඛ) හා 2024.06.05 දිනැති ලිපිය මඟින් 'මධ්‍යම පළාත් සභාවේ ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය' මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024.06.04 දිනැතිව අනුමත කර මෙම කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

02. ඒ අනුව අනුමත පරිපාටියේ මුල් පිටපත මේ සමඟ කාරුණිකව ඔබ වෙත යොමු කරමි.

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත.

පිටපත -ප්‍රධාන ලේකම්, ප්‍රධාන ලේකම් කාර්යාලය (මධ්‍යම පළාත) - කා.දැ.ගැ.ස.

19-I

# මධ්‍යම පළාත් සභාවේ ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය

හැඳින්වීම

මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ගුරුභවතුන්ගේ සේවා ස්ථාන මාරු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ යුතු විධිවිධාන නියම කිරීම සඳහා වූ ප්‍රතිපත්තියයි.

ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුභවතුන් සඳහා වන වාර්ෂික ස්ථාන මාරු, 2007.12.13 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛ 2007/20 ප්‍රකාරව ජාතික මට්ටමින් ක්‍රියාත්මක වන අතර, එය අභිබවා නොයන පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ 250 හා 251 රීතියේ විධිවිධාන වලට අනුකූලව මධ්‍යම පළාත තුළ ස්ථාන මාරු ක්‍රියාත්මක කළ යුතු අතර මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය මධ්‍යම පළාත් ගුරු ආණ්ඩුකාරවරයා අනුමත කරන දින සිට ක්‍රියාත්මක වේ.

## 1 වන කොටස

ගුරු සේවයේ ස්ථාන මාරු ප්‍රතිපත්තියේ අරමුණු හා විධි විධාන :

**ප්‍රතිපත්තියේ මුඛ්‍ය අරමුණ**

01. ප්‍රතිපත්තියේ මුඛ්‍ය අරමුණ පහත සඳහන් වේ.

අධ්‍යාපනය සැම විටම ශිෂ්‍ය කේන්ද්‍රිය විය යුතු බැවින් ගුරුභවතුන්ගේ ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීමේදී ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා ප්‍රමුඛ ස්ථානයෙහිලා සැලකීම.

**සෙසු අරමුණු**

02. සෙසු අරමුණු පහත සඳහන් වේ.

**2.1** අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය වර්ධනය කිරීමේ කාර්යය රඳා පවතින්නේ ගුරුභවතුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප මත බැවින් ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් ගුරුභවතුන්ට සිය දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කරගැනීම සඳහා අවකාශ සැලසේ.

**2.2** ගුරුභවතුන්ට වෘත්තිය සුරක්ෂිතභාවය පිළිබඳ විශ්වාසය තහවුරු වන ආකාරයට සහ ශාස්ත්‍රිය නිදහස ආරක්ෂා වන ආකාරයට අසාධාරණ ගුරු මාරු පිළිබඳව අනිසි බියකින් තොරව සේවය කළ හැකි වන පරිද්දෙන් සහ සේවා තෘප්තිය උපරිම

ගුරු ආණ්ඩුකාරතුමා විසින්
2024-06-04 දින
අනුමත කරන ලදී.

අයුරින් හිමිකරගත හැකි වන ආකාරයෙන් ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය සකස් කෙරේ.

**2.3** අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රදේශගතව දක්නට ලැබෙන විෂමතා හැකිතාක් දුරට අවම කරලීම මෙන්ම ශිෂ්‍ය මූලික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය බාධාවකින් තොරව හා අඛණ්ඩව සිදුවීම ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තියේ මූලික අරමුණක් විය යුතුය.

**2.4** කිසියම් ප්‍රදේශයකට හා පාසලකට සීමා වී ඇති මානව සම්පත් දිවයිනේ අනෙක් ප්‍රදේශයන්හි වෙසෙන ජනතාවට ද ප්‍රයෝජනවත් වන ආකාරයට ගුරු සේවයේ නියුතු මානව සම්පත් සාධාරණ පරිද්දෙන් බෙදී යන බවට ගුරු ස්ථාන මාරු ප්‍රතිපත්තිය තුළින් වගබලා ගත හැකි විය යුතුය.

**2.5** එකම ප්‍රදේශයක හෝ එකම පාසලක අඛණ්ඩව සේවය කිරීමෙන් ඇතිවන ඒකාකාරී බව ගුරු වෘත්තිය සංවර්ධනය කෙරෙහිද අහිතකර ලෙස බලපාන බැවින් විවිධ ප්‍රදේශවල, විවිධ සමාජ ආර්ථික හා සංස්කෘතික පරිසරවල ඇති පාසල්වල සේවය සඳහා අවස්ථාව සැලසීමටත් නොයෙකුත් අත්දැකීම් ලබාගනිමින් තම කාර්යක්ෂමතාවය වර්ධනය කරගැනීමටත් සියලුම ගුරුවරුන්ට අවස්ථා ලැබිය යුත්තේය.

**2.6** ක්ෂේත්‍රයේ මානව සම්පත් විධිමත් කළමනාකරණය තුළින් උපරිම කාර්යක්ෂමතාවය කෙරෙහි යොමු කරලීම සඳහා මෙම ප්‍රතිපත්තිය මඟින් ඉඩ ප්‍රස්ථා සලසා දිය යුතුය.

**2.7** ගුරුවරුන්ගේ වාර්ෂික ස්ථාන මාරු කිරීම් විධිමත්ව හා විනිවිද භාවයකින් යුක්තව ගුරු මාරු මණ්ඩලය හරහා ක්‍රියාත්මක කළ යුතුය.

**2.8** පහත සඳහන් කාරණා සඳහා හැර ගුරු සේවයේ ස්ථාන මාරුවීම් සිදු නොකළ යුතු ය.

2.8.1 වාර්ෂික ස්ථාන මාරු වීම්

2.8.2. ගුරුභවතුන්ගේ වෛද්‍ය හේතූන් මත කෙරෙන ස්ථාන මාරු වීම්.

2.8.3. සුහද ස්ථාන මාරුවීම්.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 08 - 04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (වැ.පළා.)

14-II

2.8.4. විනය හේතු මත කෙරෙන ස්ථාන මාරු වීම්

2.8.5. සේවා අවශ්‍යතාවය මත කෙරෙන ස්ථාන මාරුවීම්

2.8.6. අතිරික්ත වන ගුරුභවතුන් තුලනය කිරීම සඳහා කෙරෙන ස්ථාන මාරු වීම්

## 11 වන කොටස
## වාර්ෂික ස්ථාන මාරු වීම්

වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය

03. ගුරුභවතුන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීම සඳහා ගුරු සේවයේ ස්ථානු මාරු මණ්ඩල ස්ථාපනය කිරීම

**3.1** පහත සඳහන් මට්ටම්වල ගුරුසේවයේ ස්ථාන මාරු මණ්ඩල ස්ථාපනය කළ යුතුය.

3.1.1 කලාප අධ්‍යාපන කාර්යාල මට්ටමින් (කලාප ගුරු ස්ථාන මාරු මණ්ඩලය)

3.1.2 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මට්ටමින් (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු ස්ථාන මාරු මණ්ඩලය

කලාප ගුරු මාරු මණ්ඩල

**3.2** කලාප අධ්‍යාපන කාර්යාලයක ගුරු සේවයේ ස්ථාන මාරු මණ්ඩලය

පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

3.2.1 කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරන නිලධාරියෙක් (සභාපති)

3.2.2 කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු ස්ථාන මාරු සම්බන්ධව කටයුතු කරන විධායක/මාණ්ඩලික නිලධාරියා

3.2.2 හි සඳහන් තනතුර පුරප්පාඩු වී ඇති විට එම රාජකාරි ඉටුකරන අනුප්‍රාප්තික නිලධාරියා ඒ වෙනුවට පත්කළ යුතුය.

3.2.3 විෂය භාර අධ්‍යක්ෂවරයෙක්

ගුරු ආණ්ඩුකාරතුමා විසින් 2024-06-04 දින අනුමත කරන ලදී.

3.2.4 ගුරු සේවයේ නියුක්ත මුළු නිලධාරි සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින එම සේවාවට අදාළ එක් එක් වෘත්තිය සංගමයෙන්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තිය සංගමයේ

හෝ

නියෝජිතයෙක් බැගින්

**මධ්‍යම පළාත් ගුරු මාරු මණ්ඩලය**

3.3 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු සේවයේ ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතුය

3.3.1 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු ස්ථාන මාරු කටයුතු භාර අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා (සභාපති)

තනතුර පුරප්පාඩු වී ඇති විට එම රාජකාරි ඉටු කරන අනුප්‍රාප්තික නිලධාරියා ඒ වෙනුවෙන් පත්විය යුතුය.

3.3.2 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දෙදෙනෙක්

3.3.3 ගුරු සේවයේ නියුක්ත මුළු නිලධාරි සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින එම සේවාවට අදාළ එක් එක් වෘත්තිය සංගමයෙන්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තිය සංගමයේ

හෝ

නියෝජිතයෙක් බැගින්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
20..-06-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (වා. ආ.)

වාර්ෂික ස්ථාන මාරු
ක්‍රියාත්මක විය යුතු
දිනය

3.4 ගුරුභවතුන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් සෑම වර්ෂයකම ජනවාරි 01 වන දිනට ක්‍රියාත්මක වන පරිදි විය යුතුය. එහෙත් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පන්තිවල ඉගැන්වීම් කාර්යයෙහි නිරත ගුරුභවතුන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය පැවැත්වීමෙන් අනතුරුව එළඹෙන සුදුසු දිනයක සිට ක්‍රියාත්මක කළ හැකිය.

කලාප අධ්‍යාපන
කාර්යාල වල මාරු මණ්ඩල
ක්‍රියාත්මක විය යුතු කාල සටහන

3.5 කලාප අධ්‍යාපන කාර්යාලවල ගුරු සේවයේ ස්ථාන මාරුමණ්ඩල පහත සඳහන් කාල සටහනට අනුව ක්‍රියාත්මක විය යුතුය.

| අනු අංකය | කාරණය | කාල සීමාව |
|---|---|---|
| 3.5.1 | මාර්ගගත ක්‍රමයට අයදුම්පත් කැඳවීම හා ගුරු ස්ථාන මාරුඉල්ලුම් පත්‍ර කලාප කාර්යාලවලට ලබාගැනීම | ජූනි 30 දක්වා |
| 3.5.2 | කලාප මාරු මණ්ඩල රැස්වීම හා තීරණ දැනුම් දීම | ජූනි 30 දින සිට ජූලි 15 දක්වා |
| 3.5.3 | අභියාචනා කැඳවීම, කලාප අභියාචනා මණ්ඩලය රැස්වීම හා තීරණ දැනුම් දීම සහ කලාප අභියාචනා මණ්ඩල නිර්දේශ පළාත් ගුරු මාරු මණ්ඩලයට ලබා දීම | ජූලි 15 දින සිට ජූලි 30 දක්වා |
| 3.5.4 | කලාපය තුළ සිදු කරනු ලබන ස්ථාන මාරු ලිපි නිකුත් කිරීම | අගෝස්තු 15 දිනට පෙර |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024-06-04 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස. ආ.)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ මාරු මණ්ඩලය
ක්‍රියාත්මක විය යුතු කාල රාමුව

3.6. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු සේවයේ ස්ථාන මාරු මණ්ඩලය පහත සඳහන් කාල සටහනට අනුව ක්‍රියාත්මක විය යුතුය.

| අනු අංකය | කාරණය | කාල සීමාව |
|---|---|---|
| 3.6.1 | පළාත් ගුරු මාරු මණ්ඩල රැස්වීම හා තීරණ නිකුත් කිරීම | අගෝස්තු 15 සිට සැප්තැම්බර් 15 දක්වා |
| 3.6.2 | අභියාචනා කැඳවීම , පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අභියාචනා මණ්ඩලය රැස්වීම හා තීරණ දැනුම් දීම | සැප්තැම්බර් 15 සිට සැප්තැම්බර් 25 දක්වා |
| 3.6.3 | ජාතික පාසල් හා අන්තර් පළාත් මාරු වීම් සඳහා නිර්දේශ පළාත් ලේකම් වෙත යොමු කිරීම/අන්තර් කලාප ස්ථාන මාරු තීරණ දැනුම් දීම | සැප්තැම්බර් 25 සිට ඔක්තෝබර් 10 දක්වා |

## 111 කොටස

### වාර්ෂික ගුරු ස්ථාන මාරු සම්බන්ධ අභියාචනා මණ්ඩල

කලාප ගුරු ස්ථාන මාරු
සමාලෝචන කමිටුව

04. වාර්ෂික ගුරු ස්ථාන මාරු වීම් සම්බන්ධව ලබාදුන් නිර්දේශ වෙනස් කර ගැනීම සඳහා ඉදිරිපත් වන ඉල්ලීම් නැවත සලකා බැලීම සඳහා කාර්ය පටිපාටික රීති 254 ප්‍රකාරව සමාලෝචන කමිටුවක් කලාප මට්ටමින් ස්ථාපනය කළ යුතු අතර එම සමාලෝචන කමිටුව ලෙස කලාප ගුරු මාරු මණ්ඩලයම කටයුතු කළ යුතු ය. මෙහි දී ඉල්ලීම් ඉදිරිපත් කරන ලද ගුරුභවතා කමිටුව වෙත කැඳවිය යුතු ය. එම සමාලෝචන කමිටුව,

I. කලාප ගුරු ස්ථාන මාරු මණ්ඩලය නියෝජනය කරන නිලධාරියෙකුගෙන් ද

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 06 - 04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ව. ආ)

II. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ නම් කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය නියෝජනය නොකළ වෙනත් සහකාර හෝ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ දෙදෙනෙකුගෙන් ද සමන්විත විය යුතුය.

මෙහිදී ඉල්ලීම් ඉදිරිපත් කරන ලද ගුරුභවතා කමිටුව වෙත කැඳවිය යුතුය.මෙම සමාලෝචන කටයුතු අගෝස්තු 15 වන දිනට පෙර අවසන් කළ යුතුය.

කලාප සමාලෝචන කමිටුව විසින් ලබාදෙන ලද තීරණය සම්බන්ධව ද සෑහීමකට පත් නොවන්නේ නම් ගුරුභවතාට පළාත් අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

වාර්ෂික අන්තර් කලාප/අන්තර් පළාත්/
ජාතික පාසල් ගුරු ස්ථාන මාරු සම්බන්ධ
අභියාචනා

05. ගුරු සේවයේ වාර්ෂික ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක කිරීම සඳහා අභියාචනා මණ්ඩල ස්ථාපනය කිරීම (කාර්ය පටිපාටික රීති 254 ප්‍රකාරව උපරිම නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත විය යුතුය)

පහත සඳහන් මට්ටම්වල ගුරු සේවයේ ස්ථාන මාරු අභියාචනා මණ්ඩල ස්ථාපනය කළ යුතුය.

5.1 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මට්ටමින්, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු මාරු අභියාචනා මණ්ඩලය

5.1.1 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ ගුරු ස්ථාන මාරු කටයුතු භාර අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(සභාපති)තනතුර පුරප්පාඩු වී ඇති විට එම රාජකාරි ඉටුකරන අනුප්‍රාප්තික නිලධාරියා සභාපති ලෙස පත්විය යුතුය.

5.1.2 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම්කරනු ලබන එම අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරියෙකු

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-06-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (රා. ආ.)

5.1.3 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම්කරනු ලබන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ගුරු මාරු මණ්ඩලයේ සාමාජිකයෙකු

5.1.4 ගුරු සේවයේනියුක්ත මුළු නිලධාරි සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටින එම සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයෙන්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය සමිති කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ

හෝ

නියෝජිතයෙක් බැගින්

අභියාචනා මණ්ඩල ක්‍රියාත්මක විය යුතු කාල සටහන

**5.2.** පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ මට්ටමින් ස්ථාපනය කරන ලද අභියාචනා මණ්ඩලය පහත සඳහන් කාල සටහනට අනුව ක්‍රියාත්මක විය යුතුය.

| අනු අංකය | කාරණය | කාල සීමාව |
|---|---|---|
| 5.2.1 | අභියාචනා භාරගැනීම - අන්තර් කලාප/ අන්තර් පළාත්/ජාතික පාසල් ස්ථාන මාරු සම්බන්ධව කලාප ගුරු ස්ථාන මාරු මණ්ඩල සහ පළාත් ගුරු ස්ථාන මාරු මණ්ඩල මඟින් ලබා දුන් තීරණ පිළිබඳ සෑහීමකට පත් නොවන ගුරුභවතුන්ගේ අභියාචනා | සැප්තැම්බර් 25 දින සිට ඔත්තෝබර් 10 දින දක්වා |
| 5.2.2 | 5.2.1 ට අදාළව අභියාචනා මණ්ඩල රැස්වීම හා තීරණ ලබාදීම | ඔක්තෝම්බර් 11සිට නොවැම්බර් 01 දක්වා |

**5.3.** පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ගුරු සේවයේ ස්ථාන මාරු අභියාචනා මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-06-04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ව.ආ.)

5.3.1 .පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් හෝ වෙනත් සුදුසු මාණ්ඩලික නිලධාරියෙක් (සභාපති)

5.3.2 පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් නම් කරනු ලබන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරියෙක්

5.3.3 පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම්කරනු ලබන පළාත් ගුරු මාරු මණ්ඩලයේ සාමාජිකයෙක්

5.3.4 ඒ ඒ කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් නම් කරනු ලබන මාණ්ඩලික නිලධාරියෙක්

5.3.5 ගුරු සේවයේ නියුක්ත මුළු නිලධාරි සංඛ්‍යාවෙන් 15% ක් හෝ ඊට වැඩි සාමාජික පිරිසක් සිටි එම සේවාවට අදාළ එක් එක් වෘත්තීය සංගමයෙන්

හෝ

පූර්ණ කාලීනව වෘත්තීය කටයුතු සඳහා නිලධාරියෙකු මුදාහැර ඇති එක් එක් වෘත්තීය සංගමයේ

හෝ

නියෝජිතයෙක් බැගින්

## IV වන කොටස

### වාර්ෂික ගුරු ස්ථාන මාරු ඉල්ලුම් කිරීම හා ස්ථාන මාරු සඳහා තෝරාගැනීමේ ක්‍රමවේදය

**පාසල් වර්ග කිරීම, උපරිම**
**සේවා කාලය තීරණය කිරීම**

06. මධ්‍යම පළාත තුළ ගුරුභවතුන් ස්ථාන මාරු කිරීමේදී පාසල් වර්ගීකරණය හා පත්වීම් ලිපියේ සඳහන් පදිංචි ලිපිනය අනුව සේවා ස්ථානයට ඇති දුර පදනම් කරගනිමින් ලකුණු ප්‍රදානය කරන අතර ඒ අනුව ගුරුවරුන් තමන් විසින් උපයා ගන්නා ලකුණු පදනම් කර ගනිමින් ස්ථාන මාරුවීම් ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.

මුල් පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි සැපිරීමෙන් පසුව ස්ථිර පදිංචි ලිපිනය වෙනස් වන්නේ නම් නව පදිංචි ලිපිනය ග්‍රාම නිලධාරී විසින් ලබාදෙනු ලබන පදිංචි සහතිකය පදනම් කරගනිමින් ඒ අනුව ලකුණු ප්‍රදානය කිරීම සිදුකරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 06 - 04 දින
අනුමත කරන ලදී.

වාර්ෂික ස්ථාන මාරු සඳහා
පාසල් වර්ග කිරීම

**6.1** වාර්ෂික ස්ථාන මාරු සඳහා උපයෝගී කරගැනීමට රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 01/2005 චක්‍රලේඛය අනුව සහ එයට අදාළව වන සංශෝධන ඇතුළත්ව සියලුම පාසල් පහත සඳහන් පරිදි වර්ග කරනු ලැබේ.

6.1.1 අති දුෂ්කර
6.1.2 දුෂ්කර
6.1.3 අපහසු නොවන
6.1.4 ප්‍රියමනාප/පහසු
6.1.5 ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු

උපරිම සේවා කාලය
නියම කිරීම

**07.** ගුරු භවතෙකුට ඉහත 6.1 වන ඡේදයේ විස්තර වන පාසල් වර්ගීකරණයට අනුව එක් එක් වර්ගයට අයත් පාසලක හෝ පාසල්වල අඛණ්ඩව සේවය කළ හැකි කාලය පහත සඳහන් පරිදි නියම කරනු ලැබේ.

**7.1** පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි සම්පූර්ණ කිරීමෙන් පසු එක පාසලක සේවය කළ හැකි උපරිම /අවම කාලය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 7.1.1 | අති දුෂ්කර | - අවම අවුරුදු | 03 |
| 7.1.2 | දුෂ්කර | - අවම අවුරුදු | 04 |
| 7.1.3 | අපහසු නොවන | - අවම අවුරුදු | 05 |
| 7.1.4 | ප්‍රියමනාප/පහසු | - උපරිම අවුරුදු | 08 |
| 7.1.5 | ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු | - උපරිම අවුරුදු | 06 |

පත්වීම් ලිපියේ කොන්දේසියට අනුව එම කාලය අති දුෂ්කර/දුෂ්කර සේවා ස්ථානයක සේවය කිරීමෙන් පසු ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප පාසලකට ස්ථාන මාරු විය හැකිය. එහි වසර 06 ක කාලයක් සේවය කිරීමෙන් පසුවද යළි දුෂ්කර පාසලක අවුරුදු 03 ක් හෝ අපහසු නොවන පාසලක අවුරුදු 04 ක කාලයක් සේවය කිරීම සඳහා යෙදවිය හැකිය.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 06 - 04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (ස. ආ.)

7.2 ඉහත 7.1 වගන්තිය ප්‍රකාරව මුල් පත්වීමට අදාළ අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ වීමෙන් පසුව ප්‍රියමනාප/පහසු හෝ ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු පාසලකට ස්ථාන මාරු ලැබීමට නියමිතව ඇති අතර එම කාලසීමාව අවසන්ව නැවත දුෂ්කර හෝ අපහසු නොවන පාසලකට ස්ථාන මාරු ලැබීමට හැකියාව ඇත.

අතිදුෂ්කර හෝ දුෂ්කර පාසල්වල සේවා කාලය

**08.** ගුරු භවතෙකු තමාට වයස අවුරුදු 55 සම්පූර්ණ වන තුරු තම මුළු සේවා **කාලයෙන් නියම කරනු ලබන නිශ්චිත කාල සීමාවක් අනිවාර්යයෙන්** අතිදුෂ්කර හෝ දුෂ්කර පාසල්වල සේවය කළ යුතුය.

අනිවාර්ය දුෂ්කර සේවා කාලය සම්පූර්ණ කිරීම

**09.** ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු හෝ ප්‍රිය මනාප/පහසු හෝ අපහසු නොවන හෝ පාසලක සේවය කරන ගුරු භවතුන් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම්කර නොමැති වුවත් ඔවුන් විසින් තම සේවා කාලය තුළ **අනිවාර්යයෙන් නියම** කරනු ලබන **නිශ්චිත දුෂ්කර කාල සීමාව** සම්පූර්ණ කර නොමැති නම් වාර්ෂික ස්ථාන මාරු මඟින් අති දුෂ්කර හෝ දුෂ්කර පාසල්වලින් ඉතා ප්‍රිය මනාප/වඩාත් පහසු හෝ ප්‍රියමනාප/පහසු හෝ අපහසු නොවන පාසල්වලට ස්ථාන මාරුවී පැමිණෙන ගුරු භවතුන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස ස්ථාන මාරු කළ යුතුය.

පදිංචි ස්ථානයේ සිටපාසලට ඇති දුර ප්‍රමාණය අනුව ලකුණු ගණනය කිරීමේ ක්‍රමවේදය

**9.1** මධ්‍යම පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී ස්ථාන මාරු ලබාදීම සඳහා එක් එක් ගුරුවරයා සේවය කල එක්

ගුරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 06 - 04 දින
අනුමත කරන ලදී.

එක් පාසල සඳහා නිර්ණායක 03 ක් මත ලකුණු ප්‍රදානය කිරීමක් සිදු වේ. එම නිර්ණායක පහත පරිදි වේ.

**නිර්ණායකය** 1. ස්ථිර පදිංචි ස්ථානයේ සිට සේවය කළ පාසලට ඇති දුර කිලෝමීටර් (km)වලින්
**නිර්ණායකය**2.පාසල අයත් වන වර්ගය (වඩාත් ප්‍රියමනාප , ප්‍රිය මනාප, ප්‍රියමනාප නොවන, දුෂ්කර,අති දුෂ්කර)
**නිර්ණායකය**3. පාසලේ සේවය කළ කාලය මාසවලින්

ඉහත නිර්ණායක අතරින් 2 හා 3 ස්ථිතික සාධක වන අතර 1 නිර්ණායකය ගතික නිර්ණායකයක් වන බැවින් එය තවදුරටත් විභේදනය කර ගත යුතුය. එය පහත ආකාරයට වේ.

| අනු අංකය | කාරණය | ලැබෙන ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | පොදු ප්‍රවාහන සේවය සහිත 50 km දක්වා | 1km ක් සඳහා ලකුණු ½ බැගින් |
| 02 | පොදු ප්‍රවාහන සේවය සහිත 50 km ට වැඩි | 1km ක් සඳහා ලකුණු 1 බැගින් ලකුණු උපරිම 100කි. |
| 03 | පොදු ප්‍රවාහන සේවය නොමැති දුර (පා ගමනින්, පෞද්ගලික ප්‍රවාහන මාධ්‍ය වැනි) | 1km ක් සඳහා ලකුණු 5 බැගින් උපරිම ලකුණු 25 කි. |

**9.2** පාසල් වර්ගීකරණය සඳහා ලකුණු හිමිවන ආකාරය

| අනු අංකය | පාසල් වර්ගය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | ඉතා ප්‍රියමනාප/වඩාත් පහසු | 02 |
| 02 | ප්‍රියමනාප /පහසු | 04 |
| 03 | අපහසු නොවන | 06 |
| 04 | දුෂ්කර | 09 |
| 05 | අතිදුෂ්කර | 12 |

ගරු ආණ්ඩුකාරතුමා විසින් 2024-06-04 දින අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

9.3 එක් පාසලක සේවා කාලය මාසවලින් ගණනය කරනු ලබන අතර එක් මාසයකට ලකුණු ¼ පිරිනැමේ

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| එක් පාසලකට හිමිවන ලකුණු ප්‍රමාණය | = | නිවසේ සිට පාසලට ඇති දුරට හිමිවන ලකුණ | + | පාසල් වර්ගීකරණයට හිමිවන ලකුණ | X | පාසලේ සේවය කල කාලය |

එක් එක් පාසල සඳහා ලබාගත් ලකුණුවල මුළු එකතුව ගුරුවරයා විසින් හිමිකරගත් මුළු ලකුණ වේ. ගුරු ස්ථාන මාරු ක්‍රමවේදය මාර්ගගත පද්ධතියක් ඔස්සේ ක්‍රියාත්මක වන අතර ගණනය කිරීම ස්වයංක්‍රියව පද්ධතිය මඟින් සිදුඅවේ.

මාර්ගගත අයදුම්පතෙහි මෙම කොටස (පෙර සේවා විස්තර) සඳහා ගුරුවරයා විසින් ඇතුළත් කරනු ලබන දත්ත සියල්ල අයදුම්පත යොමු කිරීමේදී (SUBMIT) මාර්ගගත පද්ධතියේ දත්ත පාදකයක් මත ගබඩා වනු ඇත.එම දත්තවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම හා ස්ථාන මාරු පිළිබඳ තීරණගැනීම සඳහා කලාප කාර්යාලවලට හා පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට ප්‍රවේශ අවස්ථා සැලසේ.

9.4 පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි කාලය උල්ලංඝනය කර ස්ථාන මාරු ඉල්ලුම් කළ නොහැක.

**සැ.යු.** මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි ආණ්ඩුකාර ලේකම්ගේ අංක GCP/05/01/34 (ගු.සේ.ලිපි) හා 2023.06.01 දිනැති ලිපියට අනුව, 2019.12.31 දින හෝ ඊට පූර්වයෙන් ලබාදී ඇති විවිධ ගුරු පත්වීම්ලාභීන් සඳහා පමණක් සේවා කාලය වසර 05ක් සම්පූර්ණ කරන අවස්ථාව වන විට ස්ථාන මාරු සඳහා අයදුම් කළ හැකිය.

9.5 යම් පාසලක සේවය කරමින් සිටින ගුරුභවතෙකුට සේවා අවශ්‍යතාවය මත දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලකට අනුයුක්තයක් ලබා දී ඇත්නම් එම සේවා කාලය දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලක සේවය කළා සේ සලකා ලකුණු ගණනය කෙරෙන අතර පහසු පාසලකට එම අනුයුක්තය ලබා දී ඇත්නම් එම සේවා කාලය දුෂ්කර හෝ අතිදුෂ්කර පාසලක සේවය නොකළා සේ සලකා ලකුණු ගණනය කෙරේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024-06-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (වැ. බ.)

9.5.1 ඉහත කී පරිදි ස්ථාන මාරු කිරීමේදී සේවා අවශ්‍යතාවය මත අනුයුක්ත කර ඇත්නම් එම අනුයුක්ත පාසල හෝ ස්ථිර පත්වීම ලබා ඇති ස්ථානය යන දෙකෙන් වැඩි ලකුණු හිමිවන ස්ථානයට අදාළව ලකුණු ගණනය කෙරේ.

9.5.2 සේවා අවශ්‍යතාවය මත නොවන අනුයුක්ත කිරීම්වලදී අනුයුක්ත සේවා ස්ථානය පදනම් කරගෙන ලකුණු ගණනය වේ.

9.6 සේවා කාලය ගණනය කිරීමේදී ගුරුභවතා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සක්‍රියව සේවයේ යෙදී සිටි කාලය සක්‍රීය සේවා කාලය ලෙස සලකනු ලැබේ.වැටුප් සහිත අධ්‍යයන නිවාඩු හා ප්‍රසූත නිවාඩු කාලය සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකේ.

9.7 ස්ථිර පදිංචි ලිපිනය තහවුරු කරගැනීම සඳහා පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරී සහතිකය සලකා බැලීමට කලාප / පළාත් මාරු මණ්ඩලවලට අවකාශය ඇත.

## V වන කොටස

## වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කිරීම

වාර්ෂික ස්ථාන මාරු
**ඉල්ලුම් කිරීම**

10. වාර්ෂික ස්ථාන මාරු දැන්වීම පුවත්පත්වල පළකිරීමෙන් අනතුරුව එහි සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය ඉක්ම යාමට මත්තෙන් ගුරුභවතෙකු තමා සේවය කරන පාසලේ විදුහල්පති මඟින් වාර්ෂික ස්ථාන මාරු ඉල්ලුම් කළ යුතුය.

## VI වන කොටස

## වාර්ෂික ස්ථාන මාරු හැරුනු විට ගුරු සේවයේ ස්ථාන මාරු කිරීමේ වෙනත් විධිවිධාන

වෛද්‍ය හේතුන් මත
කෙරෙන ස්ථාන මාරු වීම්

11. යම් ගුරුභවතෙකුට සිය සේවා ස්ථානයේ රාජකාරි කරමින් සිටියදී එම සේවා ස්ථානයේ රාජකාරී ඉටුකිරීමට නොහැකි අන්දමින් රෝගාතුරවීම හේතුවෙන් වෙනත් පහසු සේවා ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලුම් කළ හැකිය. පළාත්

ගරු ආණ්ඩුකාරතුමා විසින්
2024 - 06 - 04 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම් (වා. ආ.)

අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පත්කරන ලද සුදුසුකම් සහිත වෛද්‍යවරයෙකුගෙන් සමන්විත මණ්ඩලයක් මඟින් අදාළ නිර්දේශය ලබාගත යුතුය.

**11.1** ස්ථාන මාරුව අපේක්ෂා කරන්නේ තමා සේවය කරන අධ්‍යාපන කලාපය තුළ නම් එම ඉල්ලීම අදාළ විදුහල්පති මඟින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමුකළ යුතුය.

**11.2** ස්ථාන මාරු අපේක්ෂා කරන්නේ අධ්‍යාපන කලාපයෙන් පිටත නම් විදුහල්පති මඟින්,කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

**11.3** ස්ථාන මාරු නියෝගය ක්‍රියාත්මක කිරීමට පෙර ස්ථාන මාරු නියෝග කිරීමේ බලධරයා විසින් තමා වෙත ලැබී ඇති ඉල්ලීම සාවද්‍ය නොවන බවටත්, එම ඉල්ලීම ඉටු කිරීම සාධාරණ බවටත් රෝගාබාධය පිළිබඳ පූර්ව සටහන් කර ඇති ප්‍රතිකාර ආදිය පිළිබඳ විස්තර ඇතුළත් වෛද්‍ය වාර්තා, වෛද්‍ය මණ්ඩල වාර්තා හෝ අදාළ වන වෙනත් සාක්ෂිවලින් තහවුරු කරගත යුතුය.

සුහද ස්ථාන මාරුවීම්

12. පත්වීම් විෂය / ඉගැන්වීම් විෂය එක සමාන වන බව තහවුරු කිරීමෙන් අනතුරුව ගුරුභවතුන්ට අන්‍යෝන්‍ය සුහද ස්ථාන මාරුවීම් අයදුම්කළ හැකිය.

අතිරික්ත ගුරුභවතුන්
තුලනය කිරීම සඳහාකෙරෙන ස්ථාන මාරු වීම්

**13.** පහත දැක්වෙන හේතුන් එකක් හෝ කිහිපයක් හෝ පදනම් කොට පාසලක සේවය කරන අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු පවත්නා පාසලකට ස්ථාන මාරු කළ හැකිය.

**13.1** පාසලක් වසා දැමීමට සිදු වීම

**13.2** පාසලක පන්තියක් හෝ පන්ති කිහිපයක් වසා දැමීමට සිදුවීම

**13.3** ගුරු අවශ්‍යතා ගණනය කිරීමේ චක්‍රලේඛයට අනුව අනුමත ගුරු සංඛ්‍යාවට වඩා පාසලේ සිටින ගුරු සංඛ්‍යාව වැඩිවීම.

ගුරු ආණ්ඩුකාරතුමා විසින්
2004-06-04 දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (ස. ආ.)
[illegible]

වෙනත් කරුණු

14. යම් කලාපයක ඉතා ප්‍රියමනාප/ප්‍රියමනාප පාසලක සේවය කිරීමෙන් පසුව වෙනත් පාසලක යම් කාලසීමාවක් සේවය කිරීමෙන් අනතුරුව නැවත පෙර කී කලාපයට ස්ථාන මාරු වී පැමිණීමේදී පෙර සේවය කළ පාසලටම ස්ථාන මාරු නොකල යුතු ය.

15. පිට පළාත්වලින් ස්ථාන මාරු වී මධ්‍යම පළාතට පැමිණෙන ගුරුභවතුන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි අනිවාර්ය සේවා කාලයෙන් පසු සාමාන්‍ය පරිදි ස්ථාන මාරු ක්‍රියාවලියට ඇතුළත් වේ.

16. පද සම්බන්ධයෙන් වන පැහැදිලි කිරීම්

16.1 "ගරු ආණ්ඩුකාරවරයා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාර තුමා/ තුමිය වේ.

16.2 "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා වේ.

16.3 "දෙපාර්තමේන්තු ප්‍රධානියා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂවරයා වේ.

16.4 "වෘත්තීය සංගම්" යනුවෙන් අදහස් කරනුයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ නියෝජනය සහිත අනුමත හා ලියාපදිංචි වෘත්තීය සංගම් වේ.

16.5 "නියමිත දිනය" යන්නෙන් වාර්ෂික ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දිනය අදහස් වේ.

16.6 " ස්ථාන මාරු ප්‍රතිපත්තිය" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ වාර්ෂික ගුරුමාරු ප්‍රතිපත්තිය අදහස් වේ.

17. මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් තීරණය කරනු ලැබේ.

ගරු ආණ්ඩුකාරතුමා විසින්
..2024 - 06 - 04...... දින
අනුමත කරන ලදී.

ආණ්ඩුකාර ලේකම් (ම. ප.)

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය - නිර්දේශ කරමු

1. ගාමිණී රාජරත්න මහතා (සභාපති) ..........................
2. ඩබ්ලිව්.එම්.එස්.ඩී.වීරකෝන් මහතා (සාමාජික) ..........................
3. ඒ.එම්.ආර්.බී. තෙන්නකෝන් මහතා (සාමාජික) ..........................
4. එච්.එම්.ඩී.ආර්. හේරත් මහතා (සාමාජික) ..........................
5. ජේ.ඩී.කේ.වික්‍රමරත්න මහතා (සාමාජික) ..........................
6. පී.ටී.ජී. ගුණතිලක මහතා (සාමාජික) ..........................
7. සී.පී.එස්.ඉලංගසිංහ මහතා (සාමාජික) ..........................

දිනය:- 2024.05.21

**ආණ්ඩුකාර ලේකම්,**

2024.05.21 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 2024/1330 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන් සඳහා යෝජිත මෙම ස්ථාන මාරු ප්‍රතිපත්තිය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2024/05/30 අත්සන ..........................

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

ලේකම්

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව

ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

අනුමත කරමි / නොකරමි.

හිනිඳුම ලලිත් යූ. ගමගේ
ආණ්ඩුකාරවර
මධ්‍යම පළාත

දිනය 2024.06.04 අත්සන..........................